(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 2(4).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 ජූලි 07 බ්‍රහස්පතින්දා**

**2022 ජූලි 19 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

****** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2022 ජූලි 21 බ්‍රහස්පතින්දා)**

3451/2022

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 සිට මේ දක්වා සංචාරක ක්ෂේත්‍රයේ සේවා සපයන්නන් හට අදාළ වාහන සඳහා ලබා දී ඇති ලීසිං පහසුකම් සංඛ්‍යාව;

(ii) එවායේ මූල්‍ය වටිනාකම;

(iii) එම ලීසිං පහසුකම් සංඛ්‍යාව අතරින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලද වාරික නොගෙවා සිටීමේ සහන කාලය ලබා දී ඇති ලීසිං පහසුකම් සංඛ්‍යාව;

(iv) එම ලීසිං පහසුකම් සංඛ්‍යාවේ මූල්‍ය වටිනාකම, මුල් මුදල හා පොලී මුදල;

එක් එක් රාජ්‍ය බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2018 සිට මේ දක්වා සංචාරක ක්ෂේත්‍රයේ සේවා සපයන්නන් සඳහා ලබා දී ඇති රුපියල් මිලියනය සහ ඊට අඩු ණය පහසුකම් සංඛ්‍යාව;

(ii) ඒවායේ මූල්‍ය වටිනාකම;

(iii) එම ණය පහසුකම් සංඛ්‍යාව අතරින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලද වාරික නොගෙවා සිටීමේ සහන කාලය ලබා දී ඇති ණය පහසුකම් සංඛ්‍යාව;

(iv) එම ණය පහසුකම් සංඛ්‍යාවේ මූල්‍ය වටිනාකම, මුල් මුදල හා පොලී මුදල;

එක් එක් රාජ්‍ය බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2022 අගෝස්තු 09 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2573/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ මන්දපෝෂණ අනුපාතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පාසල් සිසුන්ගේ මන්දපෝෂණය තුරන් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2579/2022

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන අධිකරණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අධිකරණවල දැනට විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු සඳහා ගත කර ඇති කාලය සම්බන්ධයෙන් විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නේද;

(iv) අධික කාලයක් ගත වී ඇති නඩු කඩිනමින් විසඳීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අත්හිටවීමේ නියෝග සම්බන්ධයෙන් කඩිනමින් අවසන් තීරණයකට එළඹීම සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(ii) සුළු නඩු විසඳීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සමථ මණ්ඩල ක්‍රමය තවදුරටත් පුළුල් කර එය කාර්යක්ෂම කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2634/2022

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, වරාය නගර ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(ii) මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති ඍජු හා වෙනත් විදේශ ආයෝජන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයෝජනවල වටිනාකම කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනය සඳහා එම ව්‍යාපෘතිය භාවිතා කිරීමට සැලසුම් කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2652/2022

ගරු රවුෆ් හකීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික හා පළාත් පාසල්වල නායයෑමේ අවදානම හේතුවෙන් කඩා වැටීමේ අවදානමට ලක් වී ඇති පාසල් ගොඩනැගිලි හඳුනාගැනීම සඳහා සංගණනයක් පවත්වා තිබේද;

(ii) එසේ නම්, මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, කුරුණෑගල, රත්නපුර, කෑගල්ල, සහ මාතර යන එක් එක් දිස්ත්‍රික්කයේ එසේ හඳුනාගත් ගොඩනැගිලි සහිත පාසල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා හෝ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වෙන් කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2656/2022

ගරු මයන්ත දිසානායක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි පොලිස් ස්ථාන පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි වර්ෂ ගණනාවක් පැරණි බවත්;

(ii) එම පොලිස් ස්ථානවල බැරැක්ක භාවිතා කිරීමට ඉතා අපහසු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිලි නවීකරණය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පොලිස් ස්ථාන වෙතින් සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට විධිමත් සේවාවක් ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2687/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ එක් එක් ගෘහස්ථ ගෑස් අනතුර සිදු වූ ස්ථානයේ නම, ඊට අදාළ පොලිස් බලප්‍රදේශයේ නම, පරිපාලන දිස්ත්‍රික්කයේ නම, එම අනතුර හේතුවෙන් සිදු වූ හානිය සහ එම අනතුර හේතුවෙන් සිදු වූ මූල්‍යමය අලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ගෑස් අනතුරු හේතුවෙන් සිදුවූ ජීවිත හානි, තුවාල වීම් සහ දේපළ හානි වෙනුවෙන් වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඉහත සඳහන් එක් එක් අනතුර වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී මෙවැනි අනතුරු සිදුවීම වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2751/2022

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවැති යුදමය තත්ත්වය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වූ දමිළ ජනතාව දහස් ගණනක් ඉන්දියාවට සංක්‍රමණය වී එහි කඳවුරු තුළ හා පිටත රැඳී සිටින බවත්;

(ii) මේ වනවිට යුදමය තත්ත්වය අවසන් වී ඇතත්, ඉහත පිරිසෙන් ආසන්න වශයෙන් 100,000ක පමණ පිරිසක් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව සිටින බවත්;

(iii) ඉහත සඳහන් ජනතාව අතරින් කඳවුරුවලින් පිටත ස්ථානවල ජීවත්වන බොහෝ පිරිසකට ඉන්දීය රජය විසින් වීසා බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් ඔවුන් ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේදී ඉන්දියාවේ ජීවත් වූ මුළු කාලය සඳහාම වීසා බලපත්‍ර ගාස්තු ගෙවීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ජනතාව නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2774/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගිණුම් වාර්තා අනුව 2019 ජූනි 30 දිනට බදු ගෙවන්නන් විසින් නොගෙවා ඇති හිඟ බදු මුදල රුපියල් මිලියන 4,171,558 පමණ වන බවත්;

(ii) ඒ අතරින් ගිණුම් තැබීමේ දෝෂ මත වන රුපියල් මිලියන 3500 කට වඩා වැඩි හිඟ බදු ශේෂ නිරවුල් කිරීම සඳහා කාලීන පියවර ගෙන නොමැති බවත්;

(iii) සමස්ත බදු ශේෂයෙන් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් එකතු කළ අගය මත බදු හා ආදායම් බදුවලින් සමන්විත වන බවත්;

(iv) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හිඟ බදු ආදායම් අය කිරීමට / නිරවුල් කිරීමට කාලීන පියවර ගෙන නොමැති බවත්;

(v) එමඟින් එම දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය මනාව පෙන්නුම්කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රජයට අහිමි වී ඇති හිඟ බදු ආදායම අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

(iii) දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂම නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2784/2022

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනපුරා පිහිටි පාසල්වල වැඩ බැලීමේ පදනම මත සේවය කරනු ලබන විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත තුළ සේවය කරනු ලබන විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩ බැලීමේ පදනම මත පත්වීම් ලබා දී ඇති විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා නොදීමට හේතු;

(ii) එම විදුහල්පතිවරුන්ට වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා දෙනු ලබන දින වකවානු;

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ වැඩ බැලීමේ පදනමින් සේවය කරනු ලබන විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබුව ද, වර්තමානයේදී ඔවුන්ව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

(iv) එම විදුහල්පතිවරුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

3056/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන යටතේ ජාතික පාසල් බවට පත් කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iv)හි සඳහන් පාසල් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(ii) ජාතික පාසල් බවට පත් කරනු ලබන පාසල්වලට ලබා දෙනු ලබන පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 අගෝස්තු 10 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2838/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාවේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල හා දිනය;

(iv) එමඟින් උත්පාදනය වන රැකියා සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කර්මාන්තශාලාව සම්බන්ධයෙන් වංචා හා දූෂණ සිදු වන බව දන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2972/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සයිප්‍රස් ජනරජයේ ස්ථාපිත කර තිබූ ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරල් කාර්යාලය වසා දමා තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපාන ලද හේතු කවරේද;

(iii) එම කාර්යාලය වසා දැමීම හේතුවෙන් සයිප්‍රස් ජනරජයේ සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභ සාධන කටයුතුවලට දැඩි ලෙස බාධා සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3078/2022

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති ස්ථානවල නම් කවරේද;

(iii) එම මධ්‍යස්ථානවල පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා කවරේද;

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3085/2022

ගරු තවරාජා කලෛයි අරසන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ —

(i) නිවාස අවශ්‍යතා සහිත පවුල් සංඛ්‍යාව;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආධාර මත පෞද්ගලික ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) ආදර්ශ ගම්මාන ලෙස ඉදිකර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2018 සිට 2020 දක්වා වූ කාල වකවානුවේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් තිරුක්කෝවිල්, නාවිදන්වෙලි, ආලයඩිවේම්බු සහ සමන්තුරේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යුද්ධයෙන් පීඩාවට පත්වූවන් සඳහා ක්‍රියාත්මක කරන ලද නිවාස ඉදිකිරීමේ වැඩසටහනට අදාළ හිඟ මුදල් ලබා දෙනු ලබන දිනය;

(ii) එම වැඩසටහන අවසන් කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3155/2022

ගරු අනුර දිසානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාණ්ඩලික හෙදි වසන්තා මල්ලවආරච්චි මහත්මිය රිජ්වේ ආර්යා රෝහලේ සේවය කර 1985.04.01 දින විශ්‍රාම ගත් බවත්;

(ii) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2012 අනුව වැන්දඹු පුරුෂ / අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය සඳහා 2012.12.18 දින ඉල්ලුම්පත් ඉහත රෝහලට භාර දුන් බවත්;

(iii) එම ඉල්ලුම්පත් ලද බව රෝහල් අධ්‍යක්ෂකගේ අංක EBB/pp/හෙදි/ඊ.ඩී. හා 2013.01.19 දිනැති ලිපියෙන් පිළිගෙන ඇති බවත්;

(iv) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති විශ්‍රාම වැටුප් ලිපිගොනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙන්වා ගත් බවත්;

(v) ඇය 2017.12.20 දින මිය ගිය පසු කලත්‍රයා වන දයාපාල හල්පෙ ගමගේ මහතා විසින් වැන්දඹු/පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා අදාළ ලියවිලි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ ද මේ වනතෙක් එය ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් සිදු වූ වරදක් හේතුවෙන් වසන්තා මහත්මියගේ වැන්දඹු /පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප නොගෙවීම වරදක් බව පිළිගන්නේද;

(ii) එම විශ්‍රාම වැටුප ගෙවීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3157/2022

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1980 සිට මේ දක්වා විදේශීය රටක පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් පිළිබඳ තොරතුරු තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ශ්‍රී ලාංකිකයෙකු විදේශීය රටක පුරවැසිභාවය ලබා ගැනීමේදී ශ්‍රී ලංකාවේ රජය දැනුම්වත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද විදේශීය රටක පුරවැසිභාවය පමණක් හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) වර්ෂ 1989 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ලද ද්විත්ව පුරවැසිභාවය හිමිව තිබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3175/2022

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) “ළඟම පාසල හොඳම පාසල” වැඩසටහන සඳහා වර්ෂ 2015 සිට 2019 දක්වා වෙන් කරන ලද මුදල;

(ii) ඉහත සඳහන් වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද ජාතික පාසල් සහ පළාත් පාසල් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් වැඩ නිම කර ඇති සහ වැඩ නිම කර නොමැති පාසල් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3189/2022

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත ඉඩම් තිබෙන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවතින ආණ්ඩුව යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාව අතර බෙදා දුන් කොමිෂන් සභාව සතුව තිබූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත සඳහන් ඉඩම් පිහිටා තිබෙන ප්‍රදේශ කවරේද;

(iii) ඉහත සඳහන් ඉඩම් බෙදා දීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව තිබූ ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කරගනිමින් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

(iii) කොමිෂන් සභාව සතු ඉඩම් බෙදා දීමේ නව ක්‍රියාපිළිවෙළක් හඳුන්වා දී තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාපිළිවෙළ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 අගෝස්තු 12 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

12/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා දී ඇති සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කරන ලද දිනයේ සිට එය ලබා දීම දක්වා වන ක්‍රියාවලිය සඳහා නිශ්චිත කාලයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

41/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්වභාවිකව වැවෙන මිනිස් ආහාරයට සුදුසු බිම්මල් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම බිම්මල් වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) ඒ අතරින් ඒකදේශික බිම්මල් වර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ස්වයං රැකියාවක් ලෙස බිම්මල් වගා කරනු ලබන වගාකරුවන්ට අවශ්‍ය බීජ ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) ඒ සඳහා වර්ෂයකට වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) දේශීය බිම්මල් බීජ, වගාකරුවන් අතර ප්‍රචලිත කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බිම්මල් වගාකරුවන්ට රජය සහන ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

259/2022

ගරු හේෂා විතානගේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ සිදු වූ පරිසර දූෂණයට අදාළව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) පැමිණිලි වර්ගීකරණය අනුව ඒ අතරින් වැඩි වශයෙන් ලැබී ඇති පැමිණිලි වර්ගය කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් පැමිණිලි අතරින් මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ණ අනුමතිය ලබා දී ඇති ආයතන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ නීති රීති අනුව කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්නපුර මහ නගර බලප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති කර්මාන්තශාලාවලින් සිදු කරනු ලබන පරිසර දූෂණය සම්බන්ධයෙන් පරීක්ෂා කර තිබේද;

(ii) ජලයට බැර ලෝහ එකතුවීම, වායු දූෂණය සහ ශබ්ද දූෂණය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරීක්ෂාවට ලක් කරන ලද ආයතන කවරේද;

(iii) එම පරීක්ෂා කිරීම් අනුව එළඹ ඇති නිගමන කවරේද;

(iv) ජාතික පාරිසරික පනත අනුව ලබා දී ඇති උපදෙස් නොසලකා කටයුතු කිරීම හේතුවෙන් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

576/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම අතිශය වැදගත් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) මේ දක්වා ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) කෘෂි දත්ත ගබඩාව ස්ථාපිත කිරීමේදී යම් වංචාවක් සිදුවී තිබේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වනඅලි තර්ජන පවතින ප්‍රදේශ තිබෙන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රදේශ අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හඳුනාගෙන තිබේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) 2019 හා 2020 වර්ෂවලදී වනඅලි ප්‍රහාර හේතුවෙන් ඉහත ප්‍රදේශවල සිදු වී ඇති පුද්ගල මරණ සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත වර්ෂවල දී වනඅලි ප්‍රහාර හේතුවෙන් එම ප්‍රදේශවල සිදු වී ඇති වගා හානි වෙනුවෙන් වන්දි ගෙවීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

1182/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සේවය කරනු ලබන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත කර ඇති ආකාරය කවරේද;

(iii) එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා පිරවීමට ගෙන ඇති පියවර කවරේද;

(v) උතුරු පළාත සඳහා ඉහත නිලධාරීන් පත් කර නොමැති බව දන්නේද;

(vi) උතුරු පළාත සඳහා එම නිලධාරීන් පත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ට නව සේවා ව්‍යවස්ථාවක් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එය සකස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එය සකස් කරනු ලබන දිනය හා ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඇතැම් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගණනයේදී, ඔවුන් ගොවි නියාමක සහ සමෘද්ධි නියාමක ලෙස කටයුතු කරන ලද සේවා කාලය සැලකිල්ලට ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට එම සේවා කාලය ලබා දෙනු ලබන ආකාරය හා දිනය කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1189/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "නෙළුම් කුලුන" ව්‍යාපෘතිය සඳහා මුදල් සපයා ගනු ලැබූ ප්‍රභවය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ලබා ගන්නා ලද ණය මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය මගින් ඉපයීමට අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැළණි ගඟ ආශ්‍රිතව ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවලින් ඉවතලන අපවිත්‍ර ජලය එම ගඟට එක්කරනු ලබන බව දන්නේද;

(iii) එම අපවිත්‍ර ජලය හේතුවෙන් කැළණි ගං ජලයට සිදු වන හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) අපවිත්‍ර ජලය කැළණි ගඟට මුදා හැරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3293/2022

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් 2015 වර්ෂයේ සිට පළාත් පාලන ආයතනයන්ට අනියම් පදනම මත කම්කරුවන් විශාල සංඛ්‍යාවක් බඳවාගන්නා ලද බව දන්නේද;

(ii) එසේ නම්, එම කම්කරුවන් අතරින් මේ දක්වා සේවය කරනු ලබන කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කම්කරුවන් මේ වනතෙක් ස්ථිර කර නොමැති බව දන්නේද;

(iv) ඔවුන් සේවයේ ස්ථිර කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3337/2022

ගරු අලි සබ්රි රහීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම නගරයේ කාර්මික විද්‍යාලයක් ස්ථාපිත කිරීමට මා විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කාර්මික විද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා ගත වන කාලය කොපමණද;

(iii) එහි පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 2/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.3/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.4/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.5/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දේශීය කෘෂි නිෂ්පාදනයේ ඉහළ ඵලදායකත්වය සඳහා වන සතුන්ගෙන් සිදුවන වගා හානි වළක්වා ගැනීම හා වගා හානිපූරණය කිරීම,— සුළු පරිමාණ හා ගෙවතු වගා ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාව වගා කරන සාදික්කා, කරාබු, ගම්මිරිස්, පොල්, විවිධ පලතුරු ආදී ස්ථිර බෝග මෙන්ම, අල, ලූණු, එළවළු, වී ආදි කන්න බෝග වගාවන්ට රිලව්, වල් ඌරන්, ඉත්තෑවන්, අලි ආදී විවිධ වන සතුන්ගෙන් සිදුවන හානි වැලැක්වීම සඳහා අදාළ සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ජාතික කෘෂි නිෂ්පාදන ආරක්ෂිත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීමට ද, වන සතුන්ගෙන් සිදුවන වගා හානි සඳහා පූර්ණ වන්දි ලබාදෙන වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට ද, රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.6/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දහම් පාසල් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කිරීම,— දහම් පාසල් අධ්‍යාපනය තුළින් ගුණ දහමෙන් ශික්ෂිත සමාජයක් ගොඩ නැංවීමට පදනම සැකසෙන නමුදු, එම පාසල්වල පවතින

භෞතික සම්පත් හිඟය මත ඇතිවෙන දුෂ්කරතා නිසා බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු නොවන හෙයින් රටේ බහුතරයක් දහම් පාසල්වලට අත්‍යවශ්‍ය ඉගෙනුම් මේස, බංකු, ගුරු මේස, ගුරු පුටු, කළු ලෑලි, සුදු ලෑලි මෙන්ම, එහි කුඩා දහම් පුස්තකාල සඳහා පොත් අල්මාරි සපයා දීමටත්, දහම් පාසල් දරුවන් සඳහා ළමා සාරිය, ජාතික ඇඳුම වැනි ඇඳුමක් වෙනුවෙන් අවශ්‍ය රෙදි ලබාදීමටත්, පුද්ගලික අංශයේ හා දානපතීන්ගේ දායකත්වය ද සහිතව රජය විසින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.7/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුවක් හා ආර්ථික නායකත්වයක් ගොඩනැඟීම,— ශ්‍රී ලංකාව තුළ අධික පොළියට ක්‍රියාත්මකවන ක්ෂුද්‍රමූල්‍ය ණය, මූල්‍ය සමාගම් ණය, හා කල්බදු ණය උගුලෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගලවා ගනිමින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නවෝත්පාදන නිෂ්පාදන හා අගය එකතු කරන ව්‍යාපාරවල නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට, කෘෂි නිෂ්පාදකයන්ට හා සේවා සපයන ව්‍යවසායකයන්ට, ලිහිල් කොන්දේසි හා ලිහිල් පොළියකට දිගුකාලීනව ගෙවිය හැකිවන පරිදි මූල්‍ය ණය ලබාදෙන බැංකුවක් ස්ථාපනය කිරීමටත්, රටේ ආර්ථික වර්ධනයට, රැකීරක්ෂා ජනිත කිරීමට හා රටේ සම්පත්වලින් ඉහලම ඵලදායිකත්වයක් ලබාගැනීමට සහය වන ව්‍යවසායක ආර්ථික නායකත්වයක් ගොඩනැඟීමටත්, දැනට ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය ලබාදෙන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර දේශීය ව්‍යවසායකත්ව සංවර්ධන හා ආර්ථික පුනර්ජීවන කාර්යසාධන බලකායක් ඇති කිරීම උදෙසා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.8/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම,— රටක අනාගතයේ සබුද්ධික පුරවැසියකු බිහිවීමට මුල් ළමාවිය සංවර්ධනය පදනම් වන හෙයින් දිවයිනේ පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා මුල් ළමාවිය මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතියකින් පැවැත්විය යුතු බැවින් ද, එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කර, නිසි ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම නියාමනය කිරීමටත්, ඒවා පවත්වාගෙන යන ව්‍යවසායකයන්ට හා කාර්ය මණ්ඩලවලට ජාතික වෘත්තීය නිපුණතා (NVQ) සහතිකපත් තිබීම අනිවාර්ය කිරීමටත්, එවන් මධ්‍යස්ථානවල පැවතිය යුතු ඉඩකඩ හා යටිතල පහසුකම් පිළිබඳ නිර්දේශ නීතිගත කිරීමටත්, එහි සේවය කරන්නන්ට දායකත්ව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත්, දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එවන් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සහන පොළියට ණය පහසුකම් ලබාදීමටත්, අවශ්‍ය ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට රජය විසින් යෝග්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි සමූපකාර ව්‍යාපාරයක් බිහිකිරීම,— ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින සමූපකාර ක්‍රමය දැනට අඩ සියවසකට පෙර පත්කරන ලද සමූපකාර ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ අනුව ස්ථාපිත කරන ලද්දක් වන හෙයින් ද, මෙම ව්‍යාපාරය විසිඑක් වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි එනම්, ආත්මාධාරය, අන්‍යෝන්‍යාධාරය හා සකසුරුවම යන සමූපකාර මූලධර්ම මත පදනම්ව වත්මන් සියවසේ අභියෝග ජය ගැනීමට සමත්, නව තාක්ෂණය

භාවිතයෙන් මහා පරිමාණ වෙළෙඳ ජාල සමඟ සාර්ථකව තරඟ කළ හැකි ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයටත්, ප්‍රාග්ධන ගැටලුව සහ වෙළෙඳපොළ ගැටලුවලට සාර්ථක විකල්පයක් ලෙසත්, අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයටත් යොදාගත හැකි සුවිශාල වත්කම් ප්‍රමාණයක් හිමි ක්ෂේත්‍රයක් වන හෙයින් ද, වත්මන් සමුපකාර ක්‍රමය ඉහත කී අභිප්‍රායන් සංවර්ධනය කිරීම සඳහා අදාළ නව ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට, සමුපකාර ව්‍යාපාරයේ සැබෑ හිමිකරුවන් වන සමුපකාර කොටස් හිමිකරුවන්ගේ බලය වැඩිකර සමුපකාර ව්‍යාපාරය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක්කිරීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— කාන්තා අයිතීන් සුරැකීම හා කාන්තා අභිවෘද්ධිය සැලසීම,— කාන්තාවන්ගේ කායික, මානසික, සාමාජීය සුරක්ෂිතභාවය හා අභිවෘද්ධිය සැලසීම රටේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයක් වන හෙයින්, කාන්තාවන්ට නිසිලෙස නොසැළකීමට එරෙහිව නඩු විභාගයකින් දඬුවම් පැමිණවීමටත්, කාන්තා හිංසනය, අපයෝජනය, බාලවයස්කාර දැරියන් හෝ කාන්තාවන් දූෂණය කිරීම සම්බන්ධයෙන් ඇප ලබා නොදෙන නීති පැනවීමටත්, පොලීසියේ කාන්තා හා ළමා අංශයේ බලතල පුළුල් කිරීමටත්, නඩත්තු හා දික්කසාද නඩු අප්‍රමාදව විසඳීමට යෝග්‍ය අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමටත්, බස් රථවල කාන්තාවන් සඳහා එක් පසක අසුන් පෙළක් වෙන් කිරීමටත්, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල සුරාකෑමට හසුවන්නන්ගේ ණය කපා හැරීමට නීති පැනවීමටත්, සෑම නිවසකටම ජලය සහ ඉවුම් පිහුම් සඳහා අඩුවියදම් බලශක්තිය සහතික කිරීමටත්, මුළුතැන්ගෙයි උපකරණ සහන පොළියට ගැනීමට බැංකු පහසුකම් ලබාදීමටත්, වැන්දඹු කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයා ලබමින් සිටි වැටුප ගෙවීම නීතිගත කිරීමටත්, විරැකියා වැන්දඹුවන්ට රජයෙන් යැපුම් දීමනාවක් ලබාදීමටත්, සමාන සේවයට සමාන වැටුප් ලබාදීම නීතිගත කිරීමට හා කාන්තා නිෂ්පාදන අළෙවියට සුදුසු අලෙවි ජාලයක් ගොඩනැඟීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීති අණපනත් සෑදීම සඳහා රජය විසින් කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉහළ නැංවීම,— මැණික් ඉඩම් හඳුනාගැනීමේ සිට මැණික් වෙළෙඳපොළ අලෙවිය දක්වා කටයුතුවලට විවිධ පාර්ශ්ව සම්බන්ධවීම හා නොයෙකුත් ව්‍යුහයන් ක්‍රියාත්මකවීම සිදුවුවත්, ඒවා අතර අන්තර් සබඳතාවයක් නොමැතිවීම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රගතියට හා සංවර්ධනයට මහත් බාධාවක් වන හෙයින්, මෙම කර්මාන්තයට අදාළ ජාතික ප්‍රමුඛතා ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර, කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට අදාළ අන්තර් සබඳතාවය ගොඩනැංවීමටත්, අගය එකතුකරන ලද මැණික් හෝ මැණික් යොදාගත් නිෂ්පාදන දිරිගැන්වීමට බදු සහන ඇතුලු සානුබල ලබාදීමටත්, මැණික් කර්මාන්තයේ නියැලෙන පතල්කරුවන්ගේ ජීවිත අවදානමට මෙන්ම, පතල් මඟින් පරිසරයට සිදුවන හානි පූර්ණය කිරීම සඳහා රක්ෂණ ආවරණයක් ඇතිකිරීමටත්, කැණීම් බලපත්‍රයක් ලබාගැනීම පූර්ණ කොන්දේසියක් ලෙස නීතිගත කිරීමටත්, මැණික් ලාභීන්ට ලැබෙන මුදල් ප්‍රති ආයෝජනය කිරීමට අවස්ථා පුළුල් කිරීමටත්, මැණික් මිලදීගැනීමට පැමිණෙන විදේශිකයන්ට පණවන සීමා ඉවත් කිරීමටත්, මැණික් භාවිතා කර අත්කම් නිෂ්පාදන ඇතුළු ගෘහ කර්මාන්තය දක්වා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමටත්, අලෙවිකරණය දක්වා සියලු ක්ෂේත්‍රවලදී නව තාක්ෂණය යොදාගැනීමටත් යෝග්‍ය ප්‍රතිපත්ති සහ අණපනත් සෑදීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු අපනයන බෝග ආර්ථික මධ්‍යස්ථානයක් ඇතුළත් අපනයන කෘෂි බෝග ආශ්‍රිත නවෝත්පාදන කර්මාන්ත කලාපයක් බිහිකිරීම,— අතීතයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සුළු අපනයන බෝගවලට උරුමව පැවති "සිලෝන් ස්පයිස්" යන කීර්ති නාමය යළි ගොඩනඟා ගනිමින් ගෝලීය වෙළෙඳපොළ ජය ගැනීමට සුළු අපනයන බෝග බහුලව නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක පදනම් කරගත් ආර්ථික මධ්‍යස්ථාන ඇතුළත් එම බෝග ආශ්‍රිත අගය එකතු කරන ලද නවෝත්පාදන කර්මාන්ත කලාප බිහි කරන ලෙසත්, මෙම අපනයන නිෂ්පාදන සඳහා දැනට ක්‍රියාත්මක බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කර අපනයන කෘෂි බෝග කර්මාන්තයේ ප්‍රගමනයට අදාළ බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලෙසත්, සුළු අපනයන බෝග වගාකරුවන් දිරිගැන්වීමට සහනයක් ලෙස අස්වනු අළෙවියෙන් පසු ගෙවීමේ ක්‍රමයට ණය පහසුකම් ලබාදීම සහ ඒ සමඟම වගා රක්ෂණයක් ගොවිමහතුන්ට ලබාදීමේ ක්‍රමෝපායක් ඇතිකිරීමටත් රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— උඩරට නැටුම්, සම්ප්‍රදායික කලා ශිල්ප, ලී කැටයම්, මූර්ති හා ගෘහ නිර්මාණ ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම,— ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය සහ අනන්‍යතාවය විදහාපාන සාම්ප්‍රදායික උඩරට නැටුම් හා කලා ශිල්ප, චිත්‍ර, ලී කැටයම්, මූර්ති සහ ගෘහ නිර්මාණ ශිල්පය අප රටට පමණක් උරුම ඒක දේශීය විරල සංස්කෘතික හා කලා ශිල්ප වන හෙයින්, ඒවා ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, එකී උරුමයන් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමටත්, එම කලා ශිල්ප ආරක්ෂා කරමින් පවත්වාගෙන යන ශිල්පීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය ඇතිකිරීමටත්, උඩරට උරුමයන් ආරක්ෂා කොට, ප්‍රවර්ධනය කර, විධිමත් ලෙස පාලනය කිරීමට ව්‍යවස්ථාපිත පදනමක් හෝ මණ්ඩලයක් ස්ථාපිත කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.14/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ශ්‍රී ලංකාවේ විදේශ සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමෙන් 8%ක් පමණ දායකත්වයක් විදේශගත ශ්‍රම බලකායෙන් ලැබෙන හෙයින්, එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට විදේශීය ශ්‍රම ඉල්ලුමට සමගාමීව ශ්‍රමිකයන් පුහුණු කරන ආයතනයක් ස්ථාපිත කිරීමටත්, විදේශගත පුරවැසියන්ට ඡන්ද බලය භාවිත කිරීමට අවස්ථාව සලසාදීමටත්, ඔවුන්ට දායක විශ්‍රාම වැටුපක් වැනි සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටත්, විදේශ සේවය හේතු කොට ගෙන ඇතිවන නොවැළැක්විය හැකි දුර්භාග්‍ය අවස්ථාවල දී මෙන්ම අනතුරු විපත්වල දී වන්දි ලබාදෙන රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ඔවුන්ගේ ඉතුරුම්වලට වැඩි පොලියක් බැංකු මඟින් ලබාදීමටත්, නිවාස ඉදිකර ගැනීමට සහන පොලී සහ ණය ලබාදීමටත්, රජයේ රැකියා ලබාදීමේ දී විදේශගත දෙමාපියන්ගේ දරුවන්ට ප්‍රමුඛත්වයක් ලබාදීමටත්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් සහ මෙරට හා විදේශීය රැකියා ඒජන්සිවලින් සිදුවන අකටයුතුකම් කඩිනමින් විසඳීමට යෝග්‍ය ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ශ්‍රමිකයන් ලියාපදිංචියේ දී අයකරන ගාස්තු වලින් හා ගෘහ සේවයට පිටත්වීමේ දී ඒජන්සි ලබාදෙන මුදලින් කොටසක් ලබාගෙන පෙර විගමනික හා පසු විගමනික භාරයක් ඇති කිරීම සඳහාත් රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.16/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ලබාදීම,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඔවුන් ඉතා අසරණ තත්ත්වයකට පත්වී සිටින හෙයින්, මෙම සේවයේ නියුතු නිලධාරින් සඳහා විධිමත් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.17/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් කිරීම,— සංවර්ධිත රටවල පවා ගොවි ජනතාව වෙනුවෙන් විවිධ සුබසාධන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් නොවීම හේතුවෙන් ඒ සඳහා ගොවීන් ආකර්ෂණය කර ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති හෙයින් ද, ගොවි ජනතාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන ආකාරයට මෙම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් නැවත සමාලෝචනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.18/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීම,— පවත්නා කොවිඩ්-19 වසංගතය හමුවේ වර්තමානය වනවිට පාසල් වසා දමා තිබීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ප්‍රයෝජනවත් වන අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් රජය විසින් කඩිනමින් ආරම්භ කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/2022

ගරු රෝහණ බංඩාර මහතා,— පළාත් පාලන ආයතනවල රැකියා ලබා දීමේ දී සාධාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම,— මහජනතාව වෙනුවෙන් උපතේ සිට මරණය දක්වාම වැදගත් කාර්ය භාරයක් ඉටු කරන පළාත් පාලන ආයතනවල සුළු සේවක, කම්කරු ආදී පත්වීම් ලබාදීමේ දී බොහෝ විට එම පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ කොට්ඨාසයට සුවිශේෂීතාවයක් ලබාදෙන අවස්ථා වර්තමානයේ දක්නට ලැබෙන හෙයින් එම තත්ත්වය වෙනස්කොට අදාළ පළාත් පාලන ආයතනයේ සෑම කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි එම රැකියා බෙදා හැරීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.20/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් හා මානසික හිංසන හෙළාදකිමින් 2021.02.12 දින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/97/2017 මගින් දණ්ඩ නීති සංග්‍රහයේ අංක 341(i) වගන්තිය අහෝසි කිරීම, UNCRC හි වගන්ති අංක 19, 28(2) සහ 37 ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 12/2016 ක්‍රියාත්මක කිරීම සඳහා තීන්දුවක් ලබා දී ඇති හෙයින් ද, 2020.03.01 දින අවුරුදු 08 ක දැරියක් නිවසේදී වේවැලකින් පහර දී මරණයට

පත්කිරීමේ සිදුවීම පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය අවධානයට ලක් වුවද ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත හෝ ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු පියවර ගනු නොලැබූ හෙයින් ද, දරුවන්ට ඇතිවිය හැකි දීර්ඝකාලීන අහිතකර ප්‍රතිවිපාක ඉස්මතු කරමින් 2018.02.02 එක්සත් ජාතීන්ගේ ළමා අයිතීන් පිළිබඳ කමිටුවේ (UNCRC) ශ්‍රී ලංකාව පිළිබඳ අධීක්ෂණ වාර්තාව මඟින් ළමා ආරක්ෂණයේ අර්බුදකාරී තත්ත්වය, විශේෂයෙන්ම ශාරීරික දඬුවම් අවසන් කිරීම අවධාරණයට ලක් කර ඇති හෙයින් ද, 2020.10.06 දිනැති පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා අංක 304/2020 හි සඳහන් වන පරිදි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් විශාල වශයෙන් ඉහළ යන ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ සේවාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව ප්‍රකාශ කර ඇති හෙයින් ද, කඩිනමින් නීති වෙනස් කිරීමෙන් සහ පවතින නීති විධිමත්ව ක්‍රියාත්මක කිරීමෙන් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අර්බුදය අවසන් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— දුම්රිය මැදිරි දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම,— දුම්රිය දෙපාර්තුමේන්තුව විශාල භෞතික හා මානව සම්පත්වලින් සමන්විත දෙපාර්තුමේන්තුවක් වන හෙයින් ද, මෙරට දුම්රිය මැදිරි විදේශ රටවලින් ආනයනය කිරීමේදී විශාල මුදලක් විදේශ රටවලට ගලා යන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට දුම්රිය මැදිරි මෙරට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කටුවැල් බටු දේශීය වශයෙන් වගා කිරීම,— පසුගිය වසර කිහිපය තුළ කටුවැල් බටු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට ඇදී ගිය හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා දේශීය වශයෙන් කටුවැල් බටු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— ඉඟුරු වගාව ප්‍රවර්ධනය කිරීම,— පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවට ඉඟුරු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී ගිය හෙයින් මෙරටින් විදේශ රටවලට විශාල වශයෙන් ධනය ගලායාම වැළැක්වීම සඳහා ද, ඉඟුරු වගාව දේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද, කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— බුලත් ගොවීන්ගේ ගැටලු විසඳීම,— වයඹ පළාතේ සැලකිය යුතු පවුල් සංඛ්‍යාවක් බුලත් වගාවේ නිරතව සිටින අතර, වර්තමානය වනවිට එම බුලත් ගොවීන්ට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් එම තත්ත්වය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පුරන් වූ කුඹුරු අස්වැද්දීම,— රටක සංවර්ධනය සඳහා ආහාර සුරක්ෂිතතාවය ඉතා වැදගත් වන හෙයින් වයඹ පළාතේ දැනට පුරන් වී ඇති කුඹුරු යළි අස්වැද්දීම සඳහා කඩිනම් යෝග්‍ය වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම විසඳීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන රාශියක අලි-මිනිස් ගැටුම ඉතා ප්‍රබලව දක්නට ලැබෙන හෙයින් ඒ සඳහා තිරසර විසඳුමක් ලෙස සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම,— වයඹ පළාතේ විශාල පිරිසක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරත වන හෙයින් ද, එම ගොවි ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ජලය අත්‍යාවශ්‍ය සාධකයක් වන හෙයින් ද, වයඹ පළාතේ කුඩා වැව් සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම,— රටක අනාගත පරපුරට එම රටේ ඉතිහාසය ඉතා වැදගත් වන හෙයින් ද, වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන්ට සිදු වන හානි සම්බන්ධ සිදුවීම් රාශියක් වාර්තා වී ඇති හෙයින් ද, අනාගත පරපුර වෙනුවෙන් වයඹ පළාතේ පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම,— වයඹ පළාතේ සැලකිය යුතු පිරිසක් කෘෂි කර්මාන්තයේ නිරත වන හෙයින් ඔවුන්ගේ හෙට දවසේ සුරක්ෂිතතාවය සඳහා අමිල සම්පතක් වන එම පළාතේ ජල පෝෂක ප්‍රදේශ සහ ජල උල්පත් ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— එල්ලේ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— එල්ලේ ක්‍රීඩාව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ ක්‍රීඩාව වන හෙයින් එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නගරවලින් පිටතට බන්ධනාගාර රැගෙන යාම,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ බොහෝ බන්ධනාගාර නගර ආශ්‍රිතව පිහිටා තිබෙන හෙයින් ද, ඒවා තුළ දැඩි තදබදයක් පවතින හෙයින් ද, මෙම බන්ධනාගාර නගරවලින් පිටතට රැගෙන ගොස්, එම පරිශ්‍රවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවන පරිදි රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ දුෂ්කරතා සොයා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයෙකු පත්කිරීම,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විදේශ රටවල දී විවිධ දුෂ්කරතාවලට මුහුණපාන හෙයින් ද, මෙම ශ්‍රමිකයන්ට එම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල මඟින් ඉතා අල්ප සේවාවක් සිදුවන හෙයින් ද, ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන්ගේ දුෂ්කරතා සොයා බැලීමට ඔම්බුඩ්ස්මන්වරයෙකු (දුක්ගන්නාරාල කෙනෙකු) රජය විසින් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ආනවිළුන්දාව තෙත් බිම ආරක්ෂා කිරීම,— ජාත්‍යන්තර රැම්සා සම්මුතිය මඟින් තෙත් බිමක් වශයෙන් නම් කර තිබෙන ආනවිළුන්දාව තෙත් බිම අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම,— පරිසර සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා විශාල මෙහෙයක් ඉටු කරනු ලබන පුත්තලම දිස්ත්‍රික්කයේ කඩොලාන පරිසර පද්ධතිය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීමට රජය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2022

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකික විදේශ ශ්‍රමිකයන් සිය නිවෙස්වල නිරෝධායනයට ලක්කිරීම,— කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විදේශයන්හි සිය රැකියා අහිමි වී ඉතාමත් දුක්ඛිත කාල පරිච්ඡේදයක් ගත කර මෙරටට පැමිණෙන විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරෝධායනය කිරීම සඳහා රජය විසින් හඳුන්වා දී ඇති ක්‍රමවේදය මෙම අවස්ථාවේ දී ඔවුන්ට දැරිය නොහැකි වැය බරක් වන හෙයින් නියමිත කාල සීමාව තුළ සිය නිවෙස්වල නිරෝධායනය වීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 48/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය ස්ථාපනය කිරීම,— රජය නියෝජනය කරමින් හා ග්‍රාමීය ජනතාවට සමීපව කටයුතු කරමින් සුවිශාල මෙහෙවරක් ඉටු කරන ග්‍රාම නිලධාරින් සඳහා වූ ව්‍යවස්ථාවක් නිර්මාණය කර "ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය" ලෙස ස්ථාපනය කිරීමට නිසි පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සහනාධාර ලැබිය යුතු පුද්ගලයන්ට සමෘද්ධි සහනාධාර ලබාදීම,— සමෘද්ධිලාභින් මෙන්ම සමෘද්ධි සහනාධාර නොලබන අඩු ආදායම්ලාභි ජනතාව සම්බන්ධයෙන් විධිමත් සමීක්ෂණයක් සිදුකර සත්‍ය වශයෙන්ම සමෘද්ධි සහනාධාර ලැබිය යුතු පිරිස තෝරා ගෙන ඔවුන්ට එය ලබා දීමට සුදුසු පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම,— අධ්‍යාපන විද්‍යාපීඨවල විධිමත් ගුරු පුහුණුව අවසන් කරන්නන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සමෘද්ධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු ලබාදීම,— ග්‍රාමීය වශයෙන් තෝරාගනු ලබන අඩු ආදායම්ලාභී පවුල්වලට සමෘධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු බැගින් ලබා දී ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අපනයනය තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෘෂිකාර්මික රටක් ලෙස ගොවි ජනතාවට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් හා සේවා රජයේ මැදිහත්වීමෙන් ලබා දී ආනයනය වෙනුවට අපනයනය තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ තනතුරු සඳහා නිශ්චිත ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් මේ වනවිට සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශය සතුව තිබුණ ද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා මෙතෙක් ස්ථාන මාරුවීම් ජාතික

ප්‍රතිපත්තියක් සකස් කොට නොමැති හෙයින් එම නිලධාරින් අසහනයට පත්ව ඇති හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා ද ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙන්ම ගුරු/ විදුහල්පති ස්ථාන මාරුවීමේ ජාතික ප්‍රතිපත්තිය ද සක්‍රීය කිරීම සඳහා රජය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු බිත්තර කර්මාන්තය නගා සිටුවීම,— වර්තමානය වනවිට කුකුළු කෑම මිල විශාල වශයෙන් ඉහළ යාම හේතුවෙන් බිත්තර කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් ගැටලුකාරි තත්ත්වයකට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වා ගෙන බිත්තර කර්මාන්තය යළි නගා සිටුවීමට රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2022 අගෝස්තු 23 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1473/2022

ගරු රෝහණ බංඩාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර-ඇතුළු නුවර පදිංචි වී සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මේ දක්වා නීත්‍යානුකූල පදිංචිය ලබා දී නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන්ට නීත්‍යානුකූල පදිංචිය ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1732/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මේ වනවිට වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වකුගඩු රෝගීන් අතරින් මාසික වකුගඩු රෝගී දීමනාව ලබා දෙනු ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත දීමනාව ලබා ගැනීම පිණිස පොරොත්තු ලේඛනයේ සිටින රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොරොත්තු ලේඛනයේ සිටින වකුගඩු රෝගීන්ට ඉහත දීමනාව කඩිනමින් ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1949/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට අදාළ වැඩ කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එම බස් නැවතුම්පළ නවීකරණය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට සමගාමීව මහනුවර දුම්රිය ස්ථානයත් නවීකරණය කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර ගිනි නිවන හමුදා ප්‍රධාන කාර්යාලය අසල උමං මාර්ගයක් ඉදි කිරීමට තීරණය කර තිබේද;

(ii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) එම උමං මාර්ගය ඉදිකිරීමට අදාළව පරිසර වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iv) ඒ සම්බන්ධයෙන් පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1961/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1996/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ලද දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය නීත්‍යානුකූල ආයතනයක් වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව එවැනි ආයතනයක් ස්ථාපිත කිරීමට බලය තිබේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා වගකිවයුතු පුද්ගලයන් කවුරුන්ද;

(v) එම කමිටුවේ ව්‍යුහය හා සංයුතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2017 ජූනි දක්වා ඉහත කාර්යාලය සඳහා වියදම් කර ඇති මුදල කොපමණද;

(ii) එම වියදම් දරා ඇති අංශ කවරේද;

(iii) ඉහත ආයතනය රාජ්‍ය නොවන ආයතනයක් බව දන්නේද;

(iv) එසේ නම්, එම කාර්යාලය සඳහා රජයේ මුදල් වියදම් කළ හැකිද;

(v) නොඑසේ නම්, එම මුදල් වියදම් කිරීමට අනුමතිය ලබා දීමෙන් රජයේ මුදල් අවභාවිතා කර තිබේද;

(vi) ඉහත කාර්යාලයට මුදල් වෙන් කර තිබේ නම්, එයට වගකිවයුත්තන් කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දූෂණ මර්දන කමිටුවේ සාමාජිකයන්ට වැටුප් හෝ දීමනා ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) එම මුදල් නැවත අය කර ගන්නේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2008/2022

ගරු (ආචාර්ය)(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණු හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2014/2022

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 - 2019 දක්වා ස්වාධීන රූපවාහිනී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඉහත කාලය තුළ එම ආයතනයේ ක්‍රියාකාරි අධ්‍යක්ෂවරයාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රියාකාරි අධ්‍යක්ෂවරයාට සම්බන්ධ පෞද්ගලික ආයතනයක් විසින් නිෂ්පාදනය කරන ලද "ඕවර් ෂෝල්ඩර්ස්", "මහාචාර්ය යෞවනය", "සංචාරේ" යන වැඩසටහන් විකාශය කිරීම සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ස්වාධීන රූපවාහිනිය විසින් නිෂ්පාදනය කරන ලද "සවනක් රැස්" වැඩසටහන විකාශය කිරීම වෙනුවට එවකට එම ආයතනයේ සභාපතිවරයාගේ සහෝදරයෙකුට සම්බන්ධ ආයතනයක් විසින් නිෂ්පාදනය කරන ලද "දඹදිව" වැඩසටහන විකාශය කිරීම ගෙවන ලද මුදල කොපමණද;

(iii) එම අයථා ගනුදෙනු සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iv) ඒ සඳහා වගකිව යුතු නිලධාරීන්ගේ නම් කවරේද;

(v) එම මුදල්, වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගන්නේද;

(vi) නොඑසේ නම්, ඔවුන්ට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2024/2022

ගරු මධුර විතානගේ මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රම වාසනා අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2041/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා විශේෂ කාර්යභාර විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2045/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සුළු වාරිමාර්ග යටතට අයත්වන වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් හා අමුණු පිහිටා ඇති ප්‍රදේශවල නම් කවරේද;

(iii) ඉහත සඳහන් වැව් හා අමුණු අතරින් වර්ෂ 2015 සිට 2019 දක්වා ප්‍රතිසංස්කරණය කරන ලද වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැව් හා අමුණුවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වැව් හා අමුණු අතරින් අලුත්වැඩියා කළ යුතු බවට මේ වනවිට හඳුනාගෙන ඇති වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් 2020 වර්ෂයේදී අලුත්වැඩියා කරන ලද වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) 2021 වර්ෂයේදී අලුත්වැඩියා කිරීමට යෝජිත වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2022 අගෝස්තු 24 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2062/2022

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා නීතිය හා සාමය විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2074/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2097/2022

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පී/17 ග්‍රාම නිලධාරි වසමේ කෘෂිකාර්මික කටයුතුවල නිරතවන ජනතාවගේ වගාවන් වන අලි විසින් නිරන්තරයෙන් විනාශ කරනු ලබන බවත්;

(ii) වන අලි තර්ජනය හේතුවෙන් ඉහත ප්‍රදේශවල ජීවත්වන පාසල් ළමුන් පාසල් යාමට අකමැත්තක් දක්වන බවත්;

(iii) ප්‍රදේශයේ අලි වැටවල් වන අලින් විසින් විනාශ කර ඇති බවත්;

(iv) අලි වැට සකස් කර දෙන ලෙස අදාළ නිලධාරීන්ගෙන් ඉල්ලීම් කළද එය මේ වනතෙක් ඉටු කර නොමැති බවත්;

(v) මේ හේතුවෙන් එම ජනතාවට ප්‍රදේශය අත්හැර වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීමට සිදුවන තත්ත්වයක් උදාවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාසල්වල උගන්වනු ලබන එක් එක් විෂයට අදාළව —

(i) අනුමත ගුරුවරුන් සංඛ්‍යාව;

(ii) මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (iii) හි සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2262/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වතුකරයේ ජීවත් වන පවුල් සඳහා නිවාස පහසුකම් ලබා දීමට —

(i) මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2458/2022

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලෝමීටර් ලක්ෂයක් කාපට් අතුරා සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය කොපමණද;

(ii) මාර්ග සංවර්ධනය කිරීමේදී බොහෝ මාර්ගවල පැති කාණු සංවර්ධනය නොකිරීම විශාල ගැටලුවක් බවට පත්ව ඇති බව දන්නේද;

(iii) මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ සම්බන්ධව අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2468/2022

ගරු රෝහණ දිසානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම සතු තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) ඒ අතරින් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින සහ ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින එක් එක් කර්මාන්තශාලාවේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින කර්මාන්තශාලා එසේ පැවතීමට හේතු කවරේද;

(v) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින තේ කර්මාන්තශාලා උපයෝගී කර ගනිමින් තේ නිෂ්පාදනය කිරීමට ඉල්ලුම් කරන ලද ඉල්ලුම්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම විසින් සිය තේ කර්මාන්ත ශාලා පුද්ගලික අංශයට පවරා දී තිබේද;

(ii) එසේ නම්, එම කර්මාන්තශාලාවල නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2566/2022

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදු පදනම මත මේ වනවිට පුද්ගලික සමාගම් වෙත ලබා දී ඇති බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රජයේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල ඇති තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තශාලා අතරින් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින තේ කර්මාන්තශාලාවල වර්තමාන තත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තේ කර්මාන්තශාලා ක්‍රියාත්මක නොවීම හේතුවෙන් තේ කර්මාන්තයට අහිතකර බලපෑමක් සිදු වන්නේද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින තේ කර්මාන්තශාලා නැවත සක්‍රිය කර තේ කර්මාන්තය නගා සිටුවීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2571/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන පීඨවල එක් එක් භාෂා මාධ්‍ය අනුව පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාඨමාලාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විද්‍යාපීඨ ගුරු පුහුණුව සඳහා සිසුන් හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2580/2022

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මේ වනවිට අත්‍යවශ්‍ය භාණ්ඩ ලෙස නම් කර ඇති භාණ්ඩ වර්ගවල නම් කවරේද;

(ii) මේ වනවිට බොහෝ භාණ්ඩවල මිල කිසිදු පාලනයකින් තොරව ව්‍යාපාරිකයන් විසින් අත්තනෝමතික ලෙස ඉහළ නංවා ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) භාණ්ඩවල වෙළඳපොළ මිල පාලනය කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් අදාළ පනත නිසි පරිදි ක්‍රියාත්මක නොකරන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iv) වෙළඳපොළේ භාණ්ඩ මිල තීරණය කරනු ලබන්නේ වෙළඳපොළ බලවේග මත බව පිළිගන්නේද;

(v) එසේ නම්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යභාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?